# භාණ්ඩ හා සේවා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම - 2026
## ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය
## නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යාංශය

2026 වර්ෂය සඳහා භාණ්ඩ හා සේවා සැපයුම්කරුවන් වශයෙන් ලියාපදිංචි කිරීම සඳහා නිෂ්පාදකයන්ගෙන්/ භාණ්ඩ හා සේවා සැපයුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවීම.

| 01. සැපයුම් | | |
|---|---|---|
| | | අයිතම අංකය |
| 01 | සියලුම කාර්යාල ලිපි ද්‍රව්‍ය හා කාර්යාල උපකරණ | 1.1 |
| 02 | කාර්යාල ලී බඩු හා වානේ නිෂ්පාදන (අල්මාරි,පුටු,මේස,කැබිනට්) ආදිය | 1.2 |
| 03 | පරිගණක, මුද්‍රණ යන්ත්‍ර, ඡායා පිටපත් යන්ත්‍ර, ෆැක්ස් යන්ත්‍ර ඇතුලු සියලු ඉලෙක්ට්‍රෝනික උපාංග හා අමතර කොටස් | 1.3 |
| 04 | පරිගණක මෘදුකාංග | 1.4 |
| 05 | සියලුම ගොඩනැගිලි ද්‍රව්‍ය | 1.5 |
| 06 | මෝටර් රථ අමතර කොටස් හා උපාංග / ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ හා අමතර කොටස් | 1.6 |
| 07 | ටයර්, ටියුබ්, බැටරි (Wheel Alignment and Balancing ඇතුලුව) | 1.7 |
| 08 | ඕෆ් සෙට් හා ඩිජිටල් මුද්‍රණ කටයුතු | 1.8 |
| 09 | සියලුම ටෝනර් වර්ග සහ කාට්රිජ් වර්ග | 1.9 |
| 10 | තෑගි භාණ්ඩ හා සිහිවටන, ලෝහමය ලාංඡන කුසලාන හා පදක්කම් සාදා සැපයීම | 1.10 |
| 11 | වායු සමීකරණ යන්ත්‍ර, කම්ප්‍රේෂර් සහ වායු සමීකරණ අමතර කොටස් | 1.11 |
| 12 | සියලුම විදුලි උපකරණ හා දුරකථන පද්ධති | 1.12 |
| 13 | නිළ ඇඳුම් රෙදි සහ මසා නිමකරන ලද රෙදිපිළි( කමිස, කලිසම්, වැඩහල් ඇඳුම්, පාවහන් සහ ආරක්ෂිත පාවහන්) | 1.13 |
| 14 | හාඩ්වෙයාර් අයිතමයන් | 1.14 |
| 15 | ශ්‍රව්‍ය දෘෂ්‍ය අයිතමයන් | 1.15 |
| 16 | ලිහිසි තෙල් වර්ග | 1.16 |
| 17 | වායු වර්ග (උදා - ඇස්ටලින්) | 1.17 |
| **02. සේවා** | | |
| 01 | සියලුම කාර්යාල ලී බඩු හා උපකරණ අලුත්වැඩියාව | 2.1 |
| 02 | මෝටර් රථ අලුත්වැඩියාව (රේඩියේටර් අලුත්වැඩියාව / දුනු අලුත්වැඩියාව/ ඉන්ජෙක්ටර් පම්ප් අලුත්වැඩියාව) | 2.2 |
| 03 | වාහන වාර සේවා කටයුතු | 2.3 |
| 04 | වාහන ටින්කරින් කිරීම, පේන්ට් කිරීම, කට් ඇන්ඩ් පොලිෂ් කිරීම | 2.4 |
| 05 | වාහන කුෂන් වැඩ හා ඇතිරිලි වැඩ | 2.5 |
| 06 | වාහන වායුසමනය කිරීම | 2.6 |
| 07 | වාහන කුලියට ගැනීම කාර්/ වෑන්/ ලොරි | 2.7 |
| 08 | වාහන වයරින් සහ ඉලෙක්ට්‍රික් වැඩ | 2.8 |
| 09 | කාර්යාලීය හැඳුනුම්පත් සකස්කිරීම හා ඡායාරූපකරණය | 2.9 |
| 10 | වායුසමීකරණ අලුත්වැඩියාව හා නඩත්තු කිරීම | 2.10 |
| 11 | පරිගණක මුද්‍රණ කටයුතු, ඡායා පිටපත් යන්ත්‍ර අලුත්වැඩියා කිරීම | 2.11 |
| 12 | සනිපාරක්ෂක හා පවිත්‍රතා සේවාව | 2.12 |
| 13 | කෘමි උවදුරු පාලනය සේවාව | 2.13 |
| 14 | කාර්යාල වෙන්කිරීම (Partitioning) | 2.14 |
| 15 | CCTV සවිකිරීම හා අලුත්වැඩියා කිරීම | 2.15 |
| 16 | ගොඩනැගිලි අලුත්වැඩියාව සහ තින්ත ආලේපනය | 2.16 |
| 17 | බරවාහන යන්ත්‍රෝපකරණ අලුත්වැඩියාව | 2.17 |

I. සැපයුම් ද්‍රව්‍ය ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියට හෝ අධිකාරිය විසින් නම්කරන ස්ථාන වෙත ගෙනවිත් භාරදිය යුතුය.

II. ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් මිල ගණන් කැඳවනු ලබන අතර, බාහිර සැපයුම්කරුවන්ගෙන්ද මිල ගණන් කැඳවා අවශ්‍ය මිලදී ගැනීම් හා සේවාවන් ලබාගැනීමේ අයිතිය අධිකාරිය සතුය.

III. ව්‍යාපාරයක් ලෙස ලියාපදිංචි වී තිබිය යුතුය.

IV. Evaluation Committee (ඇගයීම් කමිටුව)

ඇගයීම් කමිටුව, ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ නිලධාරින්ගෙන් සමන්විත වන අතර, සැපයුම්කරුවන්ගේ ලියාපදිංචි ඉල්ලුම්පත් සලකා බලයි. ඉල්ලුම්පත් සම්බන්ධ සියලු ලේඛන, ගාස්තු සහ සහතික පත්‍ර සම්පූර්ණ හා නිවැරදි බවට පරික්ෂා කිරීම මෙම කමිටුවේ වගකීමකි. ඇගැයුම් කමිටුව විසින් නිර්දේශ කරන ලද සැපයුම්කරුවන් පමණක් 2026 වර්ෂය සඳහා ලියාපදිංචි කෙරෙනු ඇත.

V සැපයුම්කරුවෙක් වශයෙන් ලියාපදිංචි වීම සඳහා එක් එක් අයිතමය වෙනුවෙන් ආපසු නොගෙවන රු 2360/- ලියාපදිංචි ගාස්තුවක් ගෙවිය යුතුය.

VI ලියාපදිංචිය සඳහා ඉදිරිපත්කරනු ලබන ඉල්ලුම්පත් අදාළ ලියකියවිලි සහ ලියාපදිංචි කිරීමේ ගාස්තු සභාපති, ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය නමට රේඛනය කරන ලද චෙක්පත් සභාපති, ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය, සව්සිරිපාය, 123, විජේරාම මාවත, කොළඹ 07 යන ලිපිනයට 2026.02.06 දිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් යොමු කරන ලෙස කාරුණිකව දන්වා සිටිමි. තවද ඉහත ලිපිනයේ මුදල් අංශයට පැමිණ ලියාපදිංචි ගාස්තු ගෙවා රිසිට් පතක් ලබාගත හැක. ලියාපදිංචිය සඳහා අවශ්‍ය විස්තර ඇතුළත්වන ඉල්ලුම්පත පහත දක්වා ඇත. ඉල්ලුම්පත් ඇතුලු ලියකියවිලි බහා එවනු ලබන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම - 2026" යනුවෙන් සඳහන් කළ යුතුය.

VII සැපයුම්කරු VAT බදු ගෙවීම සඳහා ලියාපදිංචි වී ඇත්නම් VAT බදු අංකය සඳහන් දේශිය ආදායම් බදු දෙපාර්තුමේන්තුවෙන් ලබාගත් සහතිකයේ පිටපතක් අයදුම්පතට අමුණා එවිය යුතුය. එසේ ඉදිරිපත් නොකරන අයදුම්කරුවන් VAT බදු සඳහා ලියාපදිංචි වී නොමැති බවට සළකනු ඇත.

සභාපති
ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය
සව්සිරිපාය, 123, විජේරාම මාවත,
කොළඹ 07.